## 56 – තේජස මහිමය

තේජස මහිමය පිරි රජිඳාණෝ – කවුදෝ මේ රජිඳාණෝ
සැම බල සැම ජය සතු හිමිපාණෝ – ලොව පාලක සමිඳාණෝ

මුළු ලොව දෙවිඳුන් සතුවේ – සැම දෙය දෙවිඳුට හිමි වේ
සමුදුර නෙරපා ගොඩ බිම සැදුවේ – මෙම මහබල දෙවිඳුන්වේ

දෙවිඳුන් දුටුවේ කවුදෝ – සුර වත දැක්කේ කවුදෝ
ඇත්තට දිවිදුන් පිරිසුදු අතසිත – සතු අය පමණක් නොවෙදෝ

දෙවිඳුන් ආසිරි ඇසුවෝ – සමිඳුගේ යහපත ලැබුවෝ
ගැලවුම් කරුවූ සමිඳුන් ඉදිරියෙ – වැඳ වැටෙමින් පුද දෙන්නෝ

ඉපැරණි දොරටුව හරිමින් – කැඳවනු සුර රජිඳාණන්
සැම සෙත විදහා පැමිණේ සුරලොව – සැම බල නායක සමිඳුන්